# විශ්වවිද්‍යාල ප්‍රවේශය කෙරෙහි ශිෂ්‍යත්ව විභාගයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයකි

## (හම්බන්තොට දිස්ත්‍රික්කය ඇසුරින්)

ඩබ්.ජී.ආර්.රුවන්ති[1]

**සංක්ෂේපය**

අනාගත ආයෝජනයක් වශයෙන් හඳුනාගෙන තිබීමත් අත්වන ප්‍රතිලාභයන් ඉහළ වටිනාකමකින් යුක්ත වීමත් නිසා වර්තමාන ලෝකයේ අධ්‍යාපන ක්ෂේත්‍රයට ප්‍රමුඛස්ථානයක් හිමි වී ඇත. එබැවින් අධ්‍යාපනය වඩාත් තරගකාරී ස්වරූපයක් උසුල යි. ශ්‍රී ලංකාවේ තරගකාරී විභාග ද්විත්වය වන 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය හා අ.පො.ස. උසස් පෙළ විභාගය යොදා ගනිමින් ශිෂ්‍යත්ව විභාගය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති කරයි ද යන ගැටළුවට විසඳුම් මෙම පර්යේෂණය මඟින් අපේක්ෂා කරයි. ඒ අනුව "ශිෂ්‍යත්ව විභාගය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති නොකරයි" යන කල්පිතය මත පදනම් වෙමින් උක්ත වූ විභාග අතර පවතින සබඳතාවයේ ආකාරය කෙබඳු ද යන්න පරීක්ෂා කිරීමේ ප්‍රධාන අරමුණ යටතේ මෙම පර්යේෂණය සිදු කර ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල අධ්‍යාපන කලාපය තුළ 2015 වර්ෂයේ අ.පො.ස. උසස්පෙළ විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් 3142 ක් අතරින් 100ක නියැදියක් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලද 239 ක් වූ අයදුම්කරුවන්ගෙන් 50 ක් හා ප්‍රවේශය නොලද 2698 ක් වූ අයදුම්කරුවන්ගෙන් 50ක් ලෙස පොකුරු නියැදීම ක්‍රමවේදය යටතේ තෝරා ගනිමින් ද්විතීක දත්ත මූලාශ්‍ර ආශ්‍රයෙන් දත්ත රැස් කිරීම සිදුවිය. අධ්‍යයන සීමා යටතේ අනෙකුත් සාධක ස්ථාවර ව තිබිය දී ශිෂ්‍යත්ව විභාගයේ සමත් හෝ අසමත් බව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කරුවන්ට බලපෑමක් ඇති කරන්නේ දැ යි යන්න පරීක්ෂා කිරීම සිදුවන අතර යොදාගත් විචල්‍යයන් එකිනෙකින් ස්වායත්ත වේ යයි උපකල්පනය කරයි. මෙම පර්යේෂණයට අදාළව ලබාගන්නා ලද දත්ත කයි වර්ග පරීක්ෂාව යටතේ විශ්ලේෂණ කළ විට, ගණනය කරන ලද අගය 1.89ක් හා වගු අගය 14.067ක් විය. ඒ අනුව ශිෂ්‍යත්ව විභාගය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති නොවේ යයි උක්ත වූ කල්පිතය 95%ක විශ්වසනීයත්වයකින් යුතු ව තහවුරු වන බව ප්‍රකාශ කළ හැකි ය. ඒ අනුව ශිෂ්‍යත්ව විභාගයේ සමත් හෝ අසමත් බව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති නොකරන බව නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද :** *විශ්වවිද්‍යාල ප්‍රවේශය, 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය, උසස් පෙළ විභාගය, තරගකාරීත්වය*

[1]සමාජ සංඛ්‍යානය (විශේෂවේදී) දෙවන වසර, wgramesharuwanthi@gmail.com

**හැඳින්වීම**

වර්තමාන ලෝකයේ සෑම රටක් ම ප්‍රමුඛස්ථානය ලබාදෙන ක්ෂේත්‍ර අතර අධ්‍යාපනය වඩා ඉහළ මට්ටමක් හිමි කර ගනී. එබැවින් අධ්‍යාපනය වඩා තරඟකාරී ස්වරූපයක් උසුලයි. අධ්‍යාපනය සඳහා මව්පියන් සේ ම රජය ද සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් වියදම් කරයි. මේ නිසා දරුවන් අතර අධ්‍යාපනය ලැබීම සඳහා තියුණු තරඟයක් පවතිනවා සේ ම දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට දෙමාපියන් අතර ද තරඟයක් පවතී. එයට ප්‍රධාන හේතුව ලෙස අධ්‍යාපනය අනාගත ආයෝජනයක් වශයෙන් හඳුනාගෙන තිබීමත් , එයින් අත්වන ප්‍රතිලාබ ඉහළ වටිනාකමකින් යුක්ත වීමත් ය.

අධ්‍යාපනය ලබාදීම තුලින් මානව සම්පතේ ගුණාත්මකභාවය ඉහළ නැංවිය හැකි අතර රටක මානව සම්පත ගුණාත්මක බවින් ඉහළ නම් එම රටේ සංවර්ධනයට මානව සම්පතින් විශාල දායකත්වයක් ලබාගත හැකි ය. එබැවින් වර්තමානය වන විට අධ්‍යාපනය අත්‍යවශ්‍ය සාධකයක් ලෙස හඳුනා ගත හැකි ය.

**අධ්‍යාපන සංකල්පය අර්ථ දැක්වීම**

අධ්‍යාපනය නමැති සංකල්පය බාහිරින් දැකගත නොහැකි ස්පර්ශ කළ නොහැකි දෙයකි. වර්තමානය වන විට අධ්‍යාපනය නමැති සංකල්පය සමාජයෙන් බැහැර කිරීමට නොහැකි තරමට ම අත්‍යවශ්‍ය සාධකයක් ව පැවතී ම අධ්‍යාපනය යනු කුමක්දැ යි යන්න අරථ දැක්වී ම තව දුරටත් අපහසු කරවයි. එඩුකෝ (Educo) නම් ලතින් වචනානුසාරයෙන් එඩියුකේට් (Educate) යන ඉංග්‍රීසි වචනය නිර්මාණය වී තිබෙන නමුත් අධ්‍යාපනය නමැති සංකල්පය ඉහත ලතින් හෝ ඉංග්‍රීසි වචනයන්ට කොටුකර ගත නොහැකි පුළුල් පරාසයක් දක්වා විහිද යන්නකි (අන්තර්ජාලය ඇසුරිනි). ඊට හේතුව සංකීර්ණ සමාජයක ජීවත්වන මිනිසාගේ සජීවී ජීවිතය හා සම්බන්ධ වන අධ්‍යාපනය ද ඉතා සංකීරණ වීම යි

අධ්‍යාපනය පිළිබඳ විද්වතුන් ගේ මතය අනුව යමින් ප්‍රැන්සිස් බේකන් නමැති මනෝවිදයාඥවරයා විසින් අදහස් කරන ආකාරයට ප්‍රීතිමත් වාසනාවන්ත ජීවිතයක් ගෙන යාමට හැකිවන පරිදි බුද්ධිය වර්ධනය කිරීමත් ජීවන තත්ත්වය නංවාලීමත් අධ්‍යාපනය නම් වේ. (රත්නාවතී, 1999) අධ්‍යාපනය යන්න පොත-පතට හෝ විෂය නිර්දේශයකට සීමා කළ හැකි දෙයක් නොවන අතර එදිනෙදා ජීවිතයේ දී මුහුණ දෙන ගැටළු , අවස්ථා ,සිද්ධි, විපර්යාස යනාදී මේ සියල්ල ම අධ්‍යාපනය ලෙස දැක්විය හැකි ය.

මේ අනුව අධ්‍යාපනය යනු කුමක්දැ යි නිශ්චිතව ම හැඳින්වීම අපහසු නමුත් සරලාර්ථයෙන් දැක් වූ විට, පෞද්ගලික හා සමාජීය අන්තර් ක්‍රියා තුලින් ක්‍රියාත්මක වන්නා වූ වියුක්ත සංකල්පයක් වන බව පැහැදිළි කරුණකි.

## ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආරම්භය හා විකාශය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන්නකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතියක් ලෙස අධ්‍යාපනය හඳුන්වා දෙයි. (1978 2 වන ජනරජ ව්‍යවස්ථාව) ලෝකයේ සහ කලාපීය ප්‍රමිතීන්ට අනුව 2015 දී 92.63% ක වැඩිහිටි සාක්ෂරතා අනුපාතයක් ලංකා ජනගහනය තුළින් දැකගත හැකිවි ය (අධ්‍යාපන අමාත්‍යාංශය 2016). වත්මන් අධ්‍යාපන ක්‍රමය 19 වන සියවසේ දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය හා ඒකාබද්ධව ගෙන එන ලද අතර මධ්‍යම රජයේ හා පළාත් සභා යන පරිපාලන අංශ දෙකට යටත් ව පාලනය වේ

ප්‍රාථමික ,කණිෂ්ඨ ද්විතීක, ජ්‍යෙෂ්ඨ ද්විතීක, පහළ හා තෘතීක වශයෙන් ශ්‍රී ලංකා අධ්‍යාපන ව්‍යුහය කොටස් පහක් යටතේ වර්ග කළ හැකි ය (අධ්‍යාපන අමාත්‍යාංශය). ප්‍රාථමික අධ්‍යාපනය 1 ශ්‍රේණිය සිට 5 ශ්‍රේණිය දක්වා වන අතර මෙම කාලසීමාව අවසානයේ සිසුන් ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දෙයි. මෙහි දී විශිෂ්ට කුසලතා සහිත සිසුන් රජයේ ආධාර මත ජනප්‍රිය පාසල්වල අධ්‍යාපන අවස්ථා හිමිකර ගනී. අ.පො.ස. උසස් පෙළ දක්වා පාසල් අධ්‍යාපනය හැදෑරීමෙන් පසු උසස් පෙළ විභාගය විශිෂ්ට ලෙස සමත්වන අයදුම්කරුවන් ශ්‍රී ලංකා රජයේ විශ්වවිද්‍යාල සඳහා තෝරා ගනු ලබයි.

## 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය හා අ.පො.ස. උසස් පෙළ විභාගය

මධ්‍ය විද්‍යාල ශිෂ්‍යත්ව විභාගය ලෙස 1948 දී C.W.W. කන්නන්ගර මහතා විසින් ශිෂ්‍යත්ව විභාගය හඳුන්වා දෙන ලදී. (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව). 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය ආර්ථික වරප්‍රසාද අහිමි අධ්‍යාපනයට දක්ෂතා ඇති සිසුන්ට ජනප්‍රිය පාසල් ලබා ගැනීමට උපකාරීවන විභාගයක් ලෙස දැක්විය හැකි ය. මේ නිසා ම අපේක්ෂකයන් අතර විභාගය පිළිබඳ අධික තරඟය ,ජයග්‍රහණයේ ඉහළ මට්ටමට ළඟා වීමට දරන උත්සාහය දෙමව්පියන් හා ගුරුවරුන් වෙත ද ආරෝපණය වී ඇතිබව පැවසිය යුතු ය.

ශිෂ්‍යත්ව විභාගයේ මූලික අරමුණු ලෙස, ඉගෙනීමට දක්ෂ නමුත් ආර්ථික අපහසුතා සහිත සිසුන්ට ශිෂ්‍යාධාර ලබා දී ම. ජනප්‍රිය පාසල් වෙත දරුවන් ඇතුළත් කිරීම (අධ්‍යාපන අමාත්‍යාංශය) යනාදි ය මූලික අරමුණු කර ගනිමින් ආරම්භ වුව ද වර්තමානය වන විට මේ තුළ පවත්නා අධික තරඟය නිසා සිසුන් ගේ මානසික තත්ත්වයට ඍජු බලපෑමක් එල්ලවන බැවින් ශිෂ්‍යත්ව විභාගය අහෝසි කළ යුතු යයි සමාජ කතිකාවතක් ද ආරම්භ වී ඇත. ඊට ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ ශිෂ්‍යත්ව විභාගය සිසුන් ගේ පමණක් නොව ගුරුවරුන් ගේ දක්ෂතාවයන් ද මැන බලන ටියුෂන් මාෆියාව හා අත්වැල් බැඳගත් සාධකයක් ලෙස වර්තමානය වන විට පත් ව තිබීම යි. නමුත් ආර්ථික වශයෙන් පසුගාමී ,අධ්‍යාපන දක්ෂතා සහිත සිසුන් ට ජනප්‍රිය පාසලක් ලබා ගැනීමේ පහසු ම මඟ මේ නිසාවෙන් ශිෂ්‍යත්ව විභාගය පහසුවෙන් ඉවත දැමිය නොහැකි ය.

වගුව 1: ශ්‍රී ලංකාවේ සමස්ථ ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල 2006

| | |
|---|---|
| වර්ෂය | 2006 |
| අපේක්ෂකයින් ගණන | 233672 |
| ශිෂ්‍යාධාර සඳහා තෝරා ගත් සංඛ්‍යාව | 21853<br>9.55% |
| ලකුණු 70 ට වැඩි සංඛ්‍යාව | 44690<br>76.33% |

මූලාශ්‍රය: Department of Examinations (2004/206) Statistical Hand Book

ඉහතින් දක්වන ලද දත්ත අනුව 2015 වර්ෂයේ උසස්පෙළ විභාගය සඳහා මුහුණදුන් අපේක්ෂකයන් 2006 වර්ෂයේ දී ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දී ඇත ඒ අනුව අපේක්ෂකයින් 233672ක් අතරින් ශිෂ්‍යාධාර සඳහා සුදුසුකම් ලබා ඇත්තේ 9.55%ක් වැනි සුළු පිරිසකි

අ.පො.ස. උසස් පෙළ විභාගය අධ්‍යාපන අමාත්‍යාංශයේ විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබයි. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත් සිසුන්ට උසස් පෙළ විභාගය සඳහා පාසල් හා බාහිර අයදුම්කරුවන් ලෙස විභාගයට ඉදිරිපත් වි ය හැකි ය. ඉන් සුදුසුකම් ලබන පිරිස් ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා සුදුසුකම් ලබයි. උසස් පෙළ විභාගයට අයදුම් කළ හැකි ප්‍රධාන විෂය ධාරා 4කි.

ජෛවය විද්‍යා විශය ධාරාව
භෞතික විද්‍යා විශය ධාරාව
වාණිජ විශය ධාරාව
කලා විශය ධාරාව

(අධ්‍යාපන ලේකම් :- අංක 2009/16 දරණ චක්‍ර ලේඛය)

ඉහත චක්‍ර ලේඛයට අමතර ව තාක්ෂණවේදය විෂය ධාරාව ප්‍රධාන විෂය ක්ෂේත්‍ර දෙකක් යටතේ දැක්විය හැකි ය.

ඉංජිනේරු තාක්ෂණවේදය
ජෛව පද්ධති තාක්ෂණවේදය

(ED/08/01/19 දරණ 2015.11.19 දිනැති ලිපිය අනුව)

වගුව 2: ශ්‍රී ලංකාවේ සමස්ථ උසස්පෙළ විභාග ප්‍රතිඵල 2015

| 2015 | අයදුම්කරුවන් සංඛ්‍යාව. | | | | | |
|---|---|---|---|---|---|---|
| | පිරිමි | % | ගැහැණු | % | එකතුව | % |
| අයදුම් කළ සංඛ්‍යාව | 127620 | | 174881 | | 302501 | |
| විභාගයට පෙනී සිට සංඛ්‍යාව | 105728 | 82.85 | 149463 | 85.47 | 255191 | 84.36 |
| විශ්වවිද්‍යාල සඳහා අවම සුදුසුකම ලද සංඛ්‍යාව | 54730 | 51.76 | 100717 | 67.39 | 155447 | 60.91 |

මූලාශ්‍රයඃ Department of Examinations (2013/2015) Statistical Hand Book

2015 වර්ෂයේ දී 302501ක් වූ සමස්ථ අයදුම්කරුවන් අතරින් උසස්පෙළ විභාගය සඳහා මුහුණ දෙන ලද්දේ 255191ක් වූ සංඛ්‍යාවකි ඉන් විශ්වවිද්‍යාල සඳහා අවම සුදුසුකම ලද සංඛ්‍යාව 155447කි ඒ ගැහැණු අයදුම්කරුවන් 100717ක් හා පිරිමි අයදුම්කරුවන් 54730ක් වශයෙනි

ඉහත සඳහන් පරිදි ශිෂ්‍යත්ව විභාගයේ මූලික අරමුණු අනුව ශිෂ්‍යත්වය සමත් සිසුන් එක් කුලකයකට තෝරා ගනිමින් රජයේ ආධාර මත ජනප්‍රිය පාසල් තුළ අධ්‍යාපනය ලබන බැවින් ඔවුන් සියලු දෙනා ම අ.පො.ස. උසස් පෙළ විභාගය සමත් ව විශ්වවිද්‍යාලවලට ඇතුළත් විය යුතු ම ය. නමුත් ශිෂ්‍යත්වය අසමත් සිසුන් ද බහුල වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සමත්වන බැවින් උක්ත වූ අරමුණු යටතේ ශිෂ්‍යත්ව විභාගය ඇසුරින් දක්ෂතා සහිත සිසුන් වරණය කිරීමේ ගැටලු සහගත තත්ත්වයක් පවතින බව ප්‍රත්‍යක්ෂ වේ.

**උපන්‍යාසය හා අරමුණු**

ඉහත ගැටළුවට අදාළ ව "ශිෂ්‍යත්ව විභාගය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති නොකරයි" යන උපන්‍යාසය මත පර්යේෂණය ක්‍රියාත්මක වන අතර අරමුණු ලෙස,

- ශිෂ්‍යත්ව විභාගය හා විශ්වවිද්‍යාල ප්‍රවේශය අතර පවතින සබඳතාව පරීක්ෂා කිරීම
- ශිෂ්‍යත්වය සමත් සියලු සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන්නේ ද නොලබන්නේ ද යන්න පරීක්ෂා කිරීම
- ශිෂ්‍යත්වය විභාගය පැවැත්වමේ අරමුණු එලෙස ම ක්‍රියාත්මක වේ දැ යි පරීක්ෂා කිරීම

දැක්විය හැකි ය

**අධ්‍යයන ක්‍රමවේදය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල අධ්‍යාපන කලාපය තුළ 2015 වර්ෂයේ අ.පො.ස. උසස්පෙළ විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් 3142 ක් අතරින් 100ක නියැදියක් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලද 239 ක් වූ අයදුම්කරුවන්ගෙන් 50 ක් හා ප්‍රවේශය නොලද 2698 ක් වූ අයදුම්කරුවන්ගෙන් 50ක් ලෙස පොකුරු නියැදීම ක්‍රමවේදය යටතේ තෝරා ගනිමින් ද්විතීක දත්ත මූලාශ්‍ර ආශ්‍රයෙන් ද දත්ත ලබා ගැනීම සිදු විය.

**සාහිත්‍ය විමර්ශනය.**

2010 වර්ෂයේ දී පිටර්ස්බර්ග් විශ්වවිද්‍යාලයේ (University of Pittsburgh) Nermeen E.El Nokali, Heather J.Bachman, Elizabeth Votruba-Drazal යන මහාචාර්යවරුන් විසින් ළමා සෞඛ්‍ය හා මානව සංවර්ධන (NICHD) ජාතික ආයතනය හා එක් ව සිදුකරන ලද පර්යේෂණයට අනුව දෙමව්පියන් ගේ හා දරුවන් ගේ සබඳතාවය පිළිබඳ සලකා බැලීමේ දී දෙමව්පියන් ගේ මැදිහත්වීමේ වැඩිවීම තුළ ළමයින් ගේ නායකත්ව කුසලතා , අධ්‍යාපන ජයග්‍රහණ හා ක්‍රීඩා කුසලතා යනාදි යේ වර්ධනයක් දැක්වෙන අතර දෙමව්පිය අවධානය අඩුවීම තුළ කුසලතාමය ගැටළුවක් හා මානසික වර්ධනයේ පිරිහීමක් පවතින බව සොයාගෙන ඇත.

2014 වර්ෂයේ ලන්ඩන් විශ්වවිද්‍යාලයේ (University of London) Edward C. Melhuish යන පර්යේෂකයා විසින් සිදුකරන ලද පර්යේෂණයක ප්‍රතිඵල අනුව තරුණ දරුවන් ගේ මුල්විය සංවර්ධනයේ බලපෑම පිළිබඳ විමසුමට ලක් කරයි. ශිෂ්‍යාධාරලාභී දරුවන් අදාළ කර ගනිමින් මෙම පර්යේෂණය එක්සත් රාජධානිය සේ ම ඇමරිකා එක්සත් ජනපදය තුළ ද සිදුකර ඇති නමුත් සංස්කෘතිමය වශයෙන් ප්‍රතිඵල විශේෂිත නොවේ. එනම් විමසුමට ලක් කළ දෙරට තුළ ම කුඩා කළ සිට ම නිසිලෙස සිදුවන අධ්‍යාපන වර්ධනය මත තරුණ කාලයේ දරුවන් ගේ අධ්‍යාපන දක්ෂතා හා කුසලතා පදනම් වන බව මෙහි දී නිගමනය කර ඇත.

**දත්ත විශ්ලේෂණය.**

මෙම පර්යේෂණයට අදාළ දත්ත කයි වර්ග පරීක්ෂාව යටතේ විශ්ලේෂණයට භාජනය කරන අතර එය පහත සඳහන් පරිදි දැක්විය හැකි ය

වගුව 3: 2015 හම්බන්තොට දිස්ත්‍රික්කයේ අ.පො.ස. උසස්පෙළ ප්‍රතිඵල

| | |
|---|---|
| අයදුම්කරුවන් සංඛ්‍යාව | 9406 |
| විශ්වවිද්‍යාල ප්‍රවේශය අවම සුදුසුකම් ලද සංඛ්‍යාව | 5943 (63.18%) |
| සියළු විෂයන් අසමත් සංඛ්‍යාව | 824 (8.76%) |

මූලාශ්‍රය: Department of Examinations (2013/2015) Statistical Hand Book

මෙම දත්තයන්ට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ 9406 ක් වූ උසස්පෙළ අයදුම්කරුවන් අතරින් විශ්වවිද්‍යාල ප්‍රවේශය අවම සුදුසුකම් ලද සංඛ්‍යාව 5943 කි එය ප්‍රතිශතයක් ලෙස 63.18% ක් වන අතර සියළු විෂයන් අසමත් සංඛ්‍යාව 824කි එය 8.76% ක ප්‍රතිශතයක් ලෙස දැක්විය හැකි ය

ප්‍රස්ථාරය 1: 2015 තංගල්ල කලාපයේ අ.පො.ස. උසස්පෙළ ප්‍රතිඵල,




මූලාශ්‍රයඃ-Department of Examinations (2013/2015) Statistical Hand Book

ඉහතින් දකිවන ලද ප්‍රස්ථාරයට අනුව තංගල්ල කලාපය තුළ උසස්පෙළ විභාගයට මුහුණදුන් අයදුම්කරුවන් සංඛ්‍යාව 3142 කි. ඉන් 2429 ක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අවම සුදුසුකම් සපුරන අතර ප්‍රතිශතයක් වශයෙන් 77.31% කි. සියළු විෂයන් අසමත් සංඛ්‍යාව 205කි. එය ප්‍රතිශතයක් ලෙස 6.52% කි.

**කයි වර්ග පරීක්ෂාව**

ශිෂ්‍යත්වය සමත් - අසමත් බව හා විශ්වවිද්‍යාල ප්‍රවේශය (2006 වර්ෂයේ දී ශිෂ්‍යත්ව විභාගය සඳහා ත් 2015 වර්ෂයේ දී උසස්පෙළ විභාගය සඳහා ත් මුහුණදුන් අපේක්ෂකයන් අතරින් ශිෂ්‍යත්ව විභාගය හා විශ්වවිද්‍යාල ප්‍රවේශය අතර සබඳතාවක් පවතී දැ යි පරීක්ෂා කිරීම සිදු වේ)

$H_0$ - ශිෂ්‍යත්ව විභාගය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති නොකරයි

$H_1$ - ශිෂ්‍යත්ව විභාගය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති කරයි

වගුව 4: කයි වර්ග පරීක්ෂාව

| | ශිෂ්‍යත්ව විභාගය | | උසස්පෙළ විභාගය | | |
|---|---|---|---|---|---|
| සමත් | 12 | 10 | 3 | 18 | 43 |
| අසමත් | 11 | 17 | 8 | 21 | 57 |
| | 23 | 27 | 11 | 39 | 100 |

මූලාශ්‍රය :- Department of Examinations (2013/2015) Statistical Hand Book

ඉහත දත්ත වගුව 2015 වර්ෂයේ උසස්පෙළ විභාගයට මුහුණ දුන් අපේක්ෂකයන් 100 දෙනෙකුගේ පොකුරු නියැදියක් ඇසුරින් සකස් කරන ලද්දකි. මෙහි දී විශ්වවිද්‍යාල ප්‍රවේශය ලද හා ප්‍රවේශය නොලද අපේක්ෂකයින් 50 බැගින් ගෙන දත්ත ලබා ගැනීම සිදුවිය.

ලබා ගන්නා ලද දත්ත කයි වර්ග පරීක්ෂාවට අනුව විශ්ලේෂණය කළ විට,ගණනය කරන ලද අගය 1.89ක් ලෙස ද වගු අගය 14.067ක් ලෙස ද දැක්විය හැකි ය. ඒ අනුව, ශිෂ්‍යත්ව විභාගය විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති නොකරයි ලෙස පර්යේෂණය ආරම්භයේ දී ගොඩ නගන ලද කල්පිතය 95% ක විශ්වසනීයත්වයකින් යුතුව තහවුරු වන බව ප්‍රකාශ කළ හැකි ය. ඒ අනුව ශිෂ්‍යත්ව විභාගයේ සමත් හෝ අසමත් බව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති නොකරන බව නිගමනය කළ හැකි ය.

**සමාලෝචනය**

"ශිෂ්‍යත්ව විභාගයේ සමත් හෝ අසමත් බව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා බලපෑමක් ඇති නොකරයි" යන උපකල්පනය තෘප්ත වේ දැ යි පරීක්ෂා කිරීම සඳහා සිදුකරන ලද මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණයට අනුව උක්ත වූ උපකල්පනය තහවුරු වූ බව දැකගත හැකි ය.

ඒ අනුව ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් සිසුන් සියළු දෙනාම විශ්වවිද්‍යාල ප්‍රවේශය නොලැබීමත් ශිෂ්‍යත්වය අසමත් නමුත් ඇතැම් සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සමත් වීමත් නිසා ශිෂ්‍යත්ව විභාගය තුළින් දක්ෂයන් වරණය කිරීමේ යම් ගැටළු සහගත තත්ත්වයක් පවතින බව දැකගත හැකි ය. පර්යේෂණයට ලක්කරන ලද විභාග ද්විත්වය ම සිසුන් අතර අධික තරඟයක් නිර්මාණය කර ඇති නමුත් තරඟකාරී ලෙස විභාගයට මුහුණ දීමට අවශ්‍ය පසුබිම සෑම පාසලක් සතුව නොමැතිව ම හේතුවෙන් ග්‍රාමීය පාසල්වල සිසුන් දැඩි දුෂ්කරතාවයන්ට ලක්වීම නොවැළැක්විය හැකි ය. පාසල් සමාන පහසුකම් මට්ටමින් හා පිළිගැනීමක් ඇති එකම මට්ටමක පවතී නම් පාසල්වලට ඇතුළත් කිරීම සඳහා මෙලෙස තරඟකාරී වූ ශිෂ්‍යත්ව විභාගයක් අත්‍යවශ්‍ය නොවේ.

රට තුළ පාසල් අතර සමාන අධ්‍යාපන පහසුකම් නොමැතිව ම මෙම ගැටළුවේ ප්‍රධාන හරය වේ. සිසුන් මත සෘණාත්මක ආකල්ප ඇති කිරීමට තරම් මෙම තත්ත්වය

බරපතල වුව ද වරප්‍රසාද නොලත් ග්‍රාමීය ප්‍රදේශවල දරුවන්ට ජනප්‍රිය පාසල් වැනි ප්‍රමුඛ පාසල් වෙත යාමට හැකියාවක් ලබාදෙන මෙම විභාගය පහසුවෙන් සූරා දැමිය නොහැකි ය. කෙසේ වෙතත් බොහෝ කලකට පෙර මෙම ශිෂ්‍යත්ව විභාගය හොඳ සංකල්පයකි. මෙම කාලය තුළ දී දෙමව්පියන් දරුවන් ටියුෂන් යැවීම හෝ දැඩි තරගකාරී පරිසරයකට දරුවන් යොමු කිරීමක් දැකගත නොහැකි විය. නමුත් වර්තමානය වන විට ජනප්‍රිය පාසල් නමින් පවතින පාසල් කුලකය පාසල් අතර දැවැන්ත විෂමතා ඇතිකරලීම ට සමත් ව ඇත.

ඒ අනුව සිසුන් ගේ මානසික තත්ත්වයට අහිතකර බලපෑම් ඇතිවන ලෙස පවත්වන මෙම විභාග ද්විත්වය විධිමත් යාන්ත්‍රණයකට ලක්කළ යුතු ය. එසේ ම පාසල් අතර විශමතා අවම වන පරිදි සෑම පාසලක් ම පහසුකම් මට්ටමින් හා පිළිගැනීමක් ඇති එකම මට්ටමකින් පැවතිය යුතු බව යෝජනා කළ හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Department of Examinations (2015), G.C.E. (A/L) Examination 2015 performance of candidates, Colombo, research and development branch (national Evaluation and Testing Service)

Department of Examinations (2015) grade five scholarship Examination 2015 performance of candidates, Colombo, research and development branch (national Evaluation and Testing Service)

Department of Examinations (2013/2015) Statistical Hand Book, Colombo, research and development branch (national Evaluation and Testing Service)

Karunaratne,W. (2013) Scrapping grade 5 scholarship examination pros and cons, Sunday Leader, October 13.

Herath,D. (2013) Scrapping grade five scholarship examination: The poor as cannon fodder, Sunday Times, December 28.

අධ්‍යාපන අමාත්‍යාංශය (1999), ශ්‍රී ලංකාවෙ ඉතිහාසය (4 කොටස), කොළඹ, රජයේ මුද්‍රණාලය

උඩුගම .පී (2003), නිදහසින් පසු ශ්‍රී ලංකාවෙ අධ්‍යාපනය, කොට්ටාව, සමන් ප්‍රකාශන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (2013) 2012/ 2013 අධ්‍යයන වර්ෂය ශිෂ්‍ය අත්පොත, කොළඹ , රජයේ මුද්‍රණාලය